මධ්‍යම පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයෙහි (MN-05-2006-A) සමාජ සේවා නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සංශෝධනය - 02

<table>
<tr><th>ඡේද අංකය</th><th>දැනට තිබෙන පිළිවෙල</th><th>ඡේද අංකය</th><th>යෝජිත සංශෝධනය</th><th>සංශෝධනය කිරීමට හේතුව</th></tr>
<tr>
<td>6.1</td>
<td><table>
<tr><th>අනුමත තනතුරු නාම</th><th>තනතුරු අනුමත ශ්‍රේණිය</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th><th>කාර්යයන්</th></tr>
<tr><td>සමාජ සේවා නිලධාරි</td><td>II<br>I</td><td>37</td><td>ඉහත 4 :3 සඳහන් කාර්යයන් පැවරී ඇත.<br>(පළමුවන උපලේඛණය)</td></tr>
</table></td>
<td>6.1</td>
<td><table>
<tr><th>අනුමත තනතුරු නාම</th><th>තනතුරු අනුමත ශ්‍රේණිය</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th><th>කාර්යයන්</th></tr>
<tr><td>සමාජ සේවා නිලධාරි</td><td>II<br>I</td><td>38</td><td>ඉහත 3 :4 සඳහන් කාර්යයන් පැවරී ඇත.<br>(පළමුවන උපලේඛණය)<br><br>ස්ථාන භාර නිලධාරි<br>(සමාජ සේවා නිලධාරි)<br>(දෙවන උපලේඛණය)</td></tr>
</table></td>
<td>බෝවත්ත බංගලාව වැඩිහිටි නිවාසය සඳහා අනුමත ස්ථාන භාර නිලධාරි (සමාජ සේවා නිලධාරි) තනතුර ඇතුලත් කිරීම.<br><br>4:3 ලෙස සටහන් වී ඇති ඡේද අංකය 3:4 ලෙස නිවැරදි කිරීම.</td>
</tr>
<tr>
<td>6.2</td>
<td>ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව 37 යි. ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් වේ.</td>
<td>6.2</td>
<td>ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව 38 යි. ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත්වේ.</td>
<td></td>
</tr>
</table>

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.-11.-01..... දින
අනුමත කරන ලදී

ආණ්ඩුකාර ලේකම්

දෙවන උපලේඛණය

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ වැඩිහිටි නිවාස ස්ථාන භාර නිළධාරි තනතුර සඳහා රැකියා විස්තරය

1. තනතුර හැඳින්වීම.

**1.1** තනතුර නාමය :- වැඩිහිටි නිවාස ස්ථාන භාර නිළධාරි ( සමාජ සේවා)

**1.2** දෙපාර්තමේන්තුව:- මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

**1.3** අමාත්‍යංශය :- මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය ,සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යංශය

2. තනතුරේ සාරාංශය

මධ්‍යම පළාත තුළ කායික මානසික හා සාමාජීය හා ආර්ථික වශයෙන් අවාසි සහගත තත්වයට පත්වූ පුද්ගලයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සහ සපුරා ගැනීමට සහය වීම. ඔවුන්ගේ සුභසාධන කටයුතු ඉටුකර ගැනීමට සහාය වීම. සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙවර ප්‍රකාශයට අනුව සමස්ථ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

3. තනතුරේ සම්බන්ධතාවය

**3.1** රාජකාරිවලට අදාල නියෝග උපදෙස් ලබා දීම:-

මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කොමසාරිස්

**3.2** රාජකාරි අධීක්ෂණය :-

සහකාර කොමසාරිස්

ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිළධාරි

**3.3** රාජකාරි සම්බන්ධතා පැවැත්වීම

අභ්‍යන්තර සම්බන්ධතා

1.මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස කොමසාරිස්
2.සහකාර කොමසාරිස්
3.ගණකාධිකාරි
4.ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිළධාරි
5.පරිපාලන නිළධාරි
6. සමාජ සේවා නිළධාරි
7. ස්ථානීය කාර්යය මණ්ඩලය

බාහිර සම්බන්ධතා

1. අමාත්‍යංශ ලේකම්
2. රෝහල්/ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක
3. ආගමික ස්ථාන
4. ආධාර ලාභීන්
5. දානය සපයන්නන්
6. ස්ථානගත වැඩිහිටියන් සම්බන්ධ පුද්ගලයින්
7. බැංකු
8. රාජ්‍ය නොවන සංවිධාන

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021 - 11 - 01 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

**4.** තනතුරේ වගකීම

1.ආයතන සංග්‍රහයේ XLVII හා XLVIII යන පරිච්ඡේද අනුව කටයුතු කිරීම

2. අටවිදි රීතිය අනුව කටයුතු කිරීම.

3.ආයතන සංග්‍රහය , මුදල් රෙගුලාසි ,චක්‍රලේඛ අණපනත් පිළිබඳ දැනුවත්ව ඒවාට අනුව කටයුතු කිරීම.

4.දෙපාර්තමේන්තු චක්‍රලේඛණ වලට අනුව කටයුතු කිරීම.

**කොමසාරිස් පවරන බලය මත.**

1. වැඩිහිටි නිවාසයේ සියළුම නිළධාරින්ගේ රාජකාරි අධීක්ෂණය.
2. වැඩිහිටි නිවාසයට ඇතුලත් කරන වැඩිහිටියන් ඇතුලත් වීමේ සිට මිය යන තෙක් හා මියගිය පසුද ඊට අදාල රාජකාරි අධීක්ෂණය හා මෙහෙය වීම.
3. වැඩිහිටි නිවාසයට ලැබෙන දාන ආධාර හා වෙනත් දීමනා සම්බන්ධව අධීක්ෂණය.
4. පරිහරණ ද්‍රව්‍ය, ගබඩාගත ද්‍රව්‍ය, ඉතිරි ද්‍රව්‍ය හා බැංකු කටයතු අධීක්ෂණය හා මෙහෙය වීම, දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය.
5. අදාල නිවාසයේ නඩත්තු කටයුතු සංවර්ධන කටයුතු හා පාලන කටයුතු අධීක්ෂණය හා දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය
6. වැඩිහිටියන් සම්බන්ධවත් කාර්යාල නිළධාරින් සම්බන්ධව කාර්යාල කටයුතු ලිපිගොනු සම්බන්ධ කටයුතු අධීක්ෂණය
7. නිවාසයට පරිත්‍යාග කරන වත්කම් හා දේපළ වැනි දෑ පිළිබඳ කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම.
8. විනෝද චාරිකා හෝ වෙනත් කටයුතු සඳහා එක් පුද්ගලයකුට වැඩි වැඩිහිටියන් පිරිසක් නිවාසයෙන් බැහැරට යන අවස්ථාවල කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම.
9. රෝහල්ගතවන හෝ වෙනත් අත්‍යාවශ්‍ය කටයුත්තක් සඳහා වැඩිහිටියකු බැහැරට යන්නේ නම් ඔහුගේ ආරක්ෂාව අනන්‍යතාවය තහවුරු කර ඔහුට බැහැරට යාමට අවසර දීම. රෝහල් ගත වීම හෝ වෙනත් කටයුත්තකට බැහැර යන අවස්ථාවක එක් දිනකට වැඩි කාලයක් ගතවන්නේ නම් කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම.
10. වැඩිහිටියන් සම්බන්ධ මාසික වාර්තා දෙපාර්තමේන්තුවට ලබාදීම.
11. දෛනික අදායම් බැංකු ගත කිරීම.
12. වියළි ආහාර හා වෙනත් පරිහරණ ද්‍රව්‍ය ගබඩා කිරීම, අධීක්ෂණය හා අතිරික්තය දෙපාර්තමේන්තුවට දැනුම් දී ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීම.
13. සුළු අත්මුදල් පරිහරණය පිළිබඳ අධීක්ෂණය
14. ත්‍රෛමාසිකව නිවාසය සතු සියළු වත්කම් බැරකම් මුදල් පරිහරණය ලැබීම් පිළිබඳ වාර්තා සකස් කොට කොමසාරිස්ට ඉදිරිපත් කිරීම.
15. ගිණුම්ගත මුදල් පරිහරණයේදී කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීම.
16. වැඩිහිටියන් කායික,මානසික හා සාමාජීය සුභසාධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සකස්කර ක්‍රියාත්මක කිරීම.
17. නිවාසයේ හා නිවාස භූමියේ නඩත්තු හා සංවර්ධන කටයුතු අධීක්ෂණය.
18. වැඩිහිටියන් විශේෂ ගැටළු වලදී අදාල අංශ වෙත යොමු කිරීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021-11-01 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**කාර්ය සාධන ප්‍රමිතීන්**

- ❖ මාණ්ඩලික නිළධාරින් සඳහා වූ කාර්ය සාධන ඇගයීම් ක්‍රමය භාවිතා කිරීම.
- ❖ මාසික ප්‍රගති වාර්තා හා වාර්ෂික ප්‍රගති වාර්තා නියමිත කළට ඉදිරිපත් කිරීම.

**රාජකාරි සඳහා අධිකාරි බලය ලබා ඇති අන්දම.**

මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්

**රාජකාරි කරන ස්ථානය හා වාතාවරණය**

බදාදා දිනවල දෙපාර්තමේන්තු කාර්යාල කටයුතු ,අනිකුත් දිනවල වැඩිහිටි නිවාසය
රජයේ නිවාඩු දිනවලද සේවා අවශ්‍යතාවය මත සේවය සැපයිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021-11-01....... දින
අනුමත කරන ලදී

ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

01. පී.ජී. අමරකෝන් මහතා (සභාපති) ..............................

02. ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ..............................

03. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..............................

04. ඒ.එම්. වයිස් මහතා (සාමාජික) ..............................

05. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..............................

06. ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා (සාමාජික) ..............................

07. පී.ටී.ජී. ගුණතිලක මහතා (සාමාජික) ..............................

දිනය 2021.10.12

ආණ්ඩුකාර ලේකම්,

...2021.10.12......දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක ...2021/1190 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත- ඛණ්ඩ 2 සේවා ගණයෙහි (MN-05-2006-A) සමාජ සේවා නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි සංශෝධන -අංක 02 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය ...2021.10.22...

........................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නිල මුද්‍රාව.

ටී.ඒ.බී.ඩබ්ලිව්. දයානන්ද
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි/නොකරමි

........................................
මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා

දිනය ...2021-11-01...

නීතිඥ ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත